2020.08.11 අරුණ. පිටු 4

# දළ දේශීය නිෂ්පාදිතයට කර්මාන්ත අංශයේ දායකත්වය අඩුවෙලා

ශිරන්තනි මානවඩු

මෙරට කර්මාන්ත අංශය මගින් පළමු කාර්තුවේදී දළ දේශීය නිෂ්පාදිත සඳහා ලබාදී ඇති දයකත්වය 28.4%ක් දක්වා පහත වැටී ඇති බවත්, එය 7.8%ක සෘණ වර්ධනයක් බවත් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මාර්තු මාසයේ අවසන් සතියේ සිටම ඇඳිරි නීතිය පනවා තිබීම කර්මාන්ත අංශයේ සෘණ වර්ධනයක් සඳහා හේතුව වී ඇතැයි එම දෙපාර්තමේන්තුව පෙන්වා දෙයි. විශේෂයෙන්ම මාර්තු මාසයේ අවසන් සති දෙකේදී ඇඳිරි නීතිය පැවතීම ඊට ඉතා දැඩි බලපෑමක් ඇතිකර තිබෙන බවද එම දෙපාර්තමේන්තුව පවසයි.

එම දත්තවලට අනුව ඇමරිකා එක්සත් ජනපදයෙන් සහ යුරෝපයෙන් අපනයන නිෂ්පාදන සඳහා ලැබෙන ඇණවුම් අඩුවීම සහ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය අඩුවීම නිසා කර්මාන්ත ක්ෂේත්‍රය අඩාළ වී තිබේ.

ඒ අනුව පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන -19.2%කින්, පතල් හා කැණීම් කර්මාන්තය -18.3%කින් පහත වැටී ඇත. මීට අමතරව ඉදිකිරීම් කර්මාන්තය -16%කින්, රෙදිපිළි හා ඇඟලුම් ක්ෂේත්‍රයද -13.6%කින් පහත වැටී ඇත.